# ධාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

41 වන කාණ්ඩය | 01 වන කලාපය | 2024 නොවැම්බර් කලාපය


# ධාබිඳු සාමූහිකයේ 2024 වාර්ෂික මහා සභා රැස්වීම







40 වසරක අභිමානය රැගත් ධාබිඳු සාමූහිකයේ 2024 වසරේ වාර්ෂික මහා සභා රැස්වීම 2024.10.27 වන දින පෙරවරු 11.30 සිට උත්කර්ෂවත්ව කටුනායක මහජන පුස්තකාල ගොඩනැගිල්ලේදී පවත්වනු ලැබූ අතර මෙම වැඩසටහනේ ශ්‍රී ලංකාවේ දස අතින් පැමිණි සිංහල, දෙමළ, මුස්ලිම් හා ක්‍රිස්තියානි යන සෑම ජාතියකම සහභාගිත්වය කැපී පෙනෙන්නට විය. එපමණක් නොව, කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින අප හා එකමුතුව කටයුතු කරන තවත් සිවිල් සංවිධාන වල සහභාගිත්වය මෙන්ම, නීතීඥවරුන්, ධාබිඳු අධ්‍යක්ෂක මණ්ඩලයේද සහභාගිත්වය සඳහන් කළ යුතුමය.

ධාබිඳු සාමූහිකයේ නිර්මාතෘ වන ඉන්ද්‍රා සමන්මලී මහත්මියගේ තුටු සිනහ මධ්‍යයේ උත්සවය ගලා ගිය අතර වර්තමාන ධාබිඳු විධායක අධ්‍යක්ෂිකා චමිලා තුෂාරී මහත්මිය විසින් ධාබිඳු සාමූහිකයේ ඉතිහාසය සාඩම්බරයෙන් විස්තර කරන ලදි.

2 වන පිටුවට...

## ඇතුළු පිටු


03 - පිටුව - කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ නවතම ගෝලීය දත්ත

04 පිටුව - ගෞරවණීය ඔසප් වීම මානව අයිතිවාසිකමකි

05 - 06 පිටු - අපේ වැඩ

09 පිටුව - දැන යමු හරි මඟ

10 පිටුව - සිතුවිල්ල/ප්‍රහේලිකාව

11 පිටුව - කවි පිටුව/විදෙස් පුවත්

## ඩාබිඳු සාමූහිකය

221, වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka
Web : www.dabinducollective


# බලයට පත් වූ නව රජයෙන් කම්කරු පන්තියේ අභියෝග ජය ගමු

දශක කිහිපයකට පසුව ජනතා පරිමාධිපත්‍යයික බලය තහවුරු කර ගැනීම උදෙසා ජනතාවාදී රජයක් බලයට පත්ව ඇත. සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික වශයෙන් පෙර පැවති ආණ්ඩුවල අදූරදර්ශී අනුවණ තීරණයන්හි අනිටු ප්‍රතිවිපාක වල ගොදුරුබවට පත්ව සිටින්නන්ගේ බහුතරය වූ ජනතාවට ඔවුන්ගේ පවුල තුළ වූ යහපැවැත්ම, දෛනික ජීවිත අඩපණව ගොස් ඇති මොහොතක රටේ පුරවැසියන්ට ඔවුන්ගේ ජීවන තත්වය උසස් කර ගනිමින් නිවහල් දේශයක් වෙනුවෙන් ස්වෛරීභාවය වෙනුවෙන් ඔවුන් නැවුම් බලාපොරොත්තු රඳවා ගෙන සිටී.

මේ මොහොතේ අප කාන්තාවන්ට සහ ළමයින්ට එරෙහි වූ හිංසනය සම්බන්ධයෙන් බරපතල ලෙස වින්දිතයින් බවට පත්ව සිටිමු. මේවා ලෝකයේ වඩාත්ම කඩකිරීම්වලට ලක්වන මානව හිමිකම් ලෙස හුවා දැක්විය හැක. මේ හා සැසඳෙන දත්ත ගණනය කිරීමේදී 1/3 අයෙකු තම ජීවිත කාලය තුළ ශාරීරික හෝ ලිංගික අපයෝජනයට ලක් ව ඇත. එසේම ලංකාවේ 4/10 දෙනෙකු මරණයට පත්වීම ද දුක්ඛදායකය. සමීප සහකරුවන්ගෙන් වන ලිංගික හිංසනය හා ශාරීරික හිංසනයට ගොදුරුව සිටී. සමාජ ආර්ථික තත්වය, ලිංගික දිශානතිය, ජාතිය, ජනවර්ගය, ආබාධිතභාවය හා වයස් පදනම් වූ අසමානතා හා වෙනස්කොට සැලකීම මත පදනම්ව කාන්තාවන් හා ගැහැණු ළමයින්ට ප්‍රචණ්ඩත්වය වැඩි වෙමින් පවතී. මෙවා රජයන් විසින් අවිවාදයෙන් හෙළා දැකිය යුතුය. මෙම තත්වයන්ට නීතිමය පියවර ගැනීමට මෙන්ම වරද කරුවන්ට දඬුවම් පැවරීමේ කටයුතු වෙනුවෙන් නිතී සම්පාදනය කළ යුතුයි.

C190 වැනි ප්‍රඥප්තීන් අපරානුමත කිරීමට පියවර ගැනීම, ශ්‍රම බලකායේ කාන්තා නියෝජනය ඉහළ නැංවීමට වැඩි පහසුකම් සැපයීම ද කාන්තාවන්ගේ ආරක්ෂාව, යහපැවැත්ම හා යුක්තියට ප්‍රවේශ වීම සඳහා සහය වීම ද ආයතනික මට්ටමින් ස්ත්‍රී/ පුරුෂ සමාජනතිය කේන්ද්‍ර කොටගත් ආයතනික සංස්කෘතිය ශක්තිමත් කිරීමට මෙන්ම තීරණ ගන්නා මණ්ඩලවල කාන්තා නියෝජනය වැඩි කරන මෙන් ද අප නව රජයෙන් බලාපොරොත්තු වෙමු.

1 පිටුවෙන්... **ඩාබිඳු සාමූහිකයේ 2024**

පසුව, ඩාබිඳු සාමූහිකයේ කාර්ය මණ්ඩලය විසින් ගත වූ වසරේ සිදු කළ වැඩසටහන් වල විස්තර හා ගිණුම් වාර්තා ඉදිරිපත් කළ අතර ඊට සමගාමීව ඩාබිඳු සාමූහික සංගමයේ 4 වන මහා සභා රැස්වීම ද පැවැත්වුණු අතර ලේකම් වාර්තාව ඉදිරිපත් කරන ලද්දේ ප්‍රධාන ලේකම්තුමිය විසිනි. තවද, ඩාබිඳු සාමූහික සංගමයේ පැරණි නිලධාරී මණ්ඩලය වෙනස් කිරීම, නව නිලධාරී මණ්ඩලයක් පත් කිරීම, පසුගිය වාර්තාව ඉදිරිපත් කිරීම, ගිණුම් වාර්තාව ඉදිරිපත් කිරීම ද මෙම උත්සවයේ කැපී පෙනෙන අංගයන් විය.

පැය 4ක් පුරාවට පැවැත්වූ මෙම උත්සවයට නන් දෙසින් පැමිණි ආරාධිතයන්ගෙන් උණුසුම් සුබ පැතුම් හා ප්‍රසාද ලැබුණු අතර, සිංහල හා දමිළ යන භාෂා ද්විත්වය භාවිතය ඇගයීම, ඩාබිඳු සාමූහිකයේ නැගිටීම ඇගයීම, ඩාබිඳු සාමූහිකයේ වැඩසටහන් ඇගයීම, කාර්ය මණ්ඩලය ඇගයීම හා ඩාබිඳු සාමූහිකයේ ඉදිරි අනාගතයට සුබ පැතුම් එක් කිරීම කැපී පෙනුණි.

මෙලෙස, උත්කර්ෂවත්ව පැවති උත්සවයට සහභාගි වූ සියළු දෙනා සමඟ සුහද කතා බහකින් පසුව එහි සමාප්තිය සනිටුහන් කරන ලදි.





# කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ නවතම ගෝලීය දත්ත

කාන්තාවක් උපතට පෙර සිට එනම් ගර්භණී අවධියේ සිට වැඩිහිටියෙකු ලෙස තම ජීවිතයේ අවසාන සමය දක්වාම විවිධ අවස්ථාවල විවිධාකාරයෙන් කාන්තාවන්ට එරෙහි ප්‍රචන්ඩත්වයට ලක් වේ. එක්සත් ජාතීන්ගේ කාන්තා සංවිධානයේ නවතම දත්තවලට අනුව;

ඇස්තමේන්තු කර ඇති පරිදි ලෝකයේ කාන්තාවන් මිලියන 736 ක් එනම් වයස අවුරුදු 15 සහ ඊට වැඩි කාන්තාවන් තුන්දෙනෙක්ගෙන් එක් අයෙකු පමණ සමීප සහකරුගෙන් හෝ  සහකරු නොවන පුද්ගලයන්ගෙන් ශාරීරික සහ/හෝ ලිංගික ප්‍රචණ්ඩත්වයට හෝ හිංසනයට හෝ අවම වශයෙන් එක් වරක්වත් ඔවුන්ගේ ජීවිත කාලය තුළ ගොදුරු වී ඇත.

වයස අවුරුදු 19 වන විට, සම්බන්ධතාවයක යෙදී සිටින නව යොවුන් වියේ ගැහැණු ළමයින් 4 දෙනෙකුගෙන් 1 අයෙකු (24%) සහකරුවෙකු විසින් ශාරීරිකව, ලිංගිකව හෝ මානසිකව අපයෝජනයට ලක් කර ඇත.

ලොව පුරා වයස අවුරුදු 15-19 අතර නව යොවුන් වියේ ගැහැණු ළමයින් මිලියන 15 ක් පමණ බලහත්කාරයෙන් ලිංගිකව හැසිරී ඇත. බොහෝ රටවල නව යොවුන් වියේ ගැහැණු ළමයින් වත්මන් හෝ හිටපු ස්වාමිපුරුෂයා, සහකරු හෝ පෙම්වතා විසින් බලහත්කාරයෙන් ලිංගිකව එක්වීමේ  අවදානමට ලක්කර ඇත.

කාන්තාවන්ට එරෙහි බොහෝ ප්‍රචණ්ඩත්වයන් වත්මන් හෝ හිටපු ස්වාමිපුරුෂයන් හෝ සමීප සහකරුවන් විසින් සිදු කරනු ලැබේ. වයස අවුරුදු 15 සහ ඊට වැඩි (සියයට 26) කාන්තාවන් මිලියන 640 කට වඩා සමීප සහකරු හිංසනයට ලක්ව ඇත.

2023 දී ලොව පුරා කාන්තාවන් සහ ගැහැණු ළමයින් 51,100 ක් පමණ ඔවුන්ගේ සමීප සහකරුවන් හෝ වෙනත් පවුලේ සාමාජිකයන් විසින් ඝාතනය කරන ලදී. මෙයින් අදහස් කරන්නේ සාමාන්‍යයෙන් දිනකට කාන්තාවන් හෝ ගැහැණු ළමුන් 140ක් තම පවුලේ කෙනෙකු අතින් ඝාතනය වන බවයි. සියලුම කාන්තා ඝාතනවලින් සියයට 60ක් සමීප සහකරුවන් හෝ වෙනත් පවුලේ සාමාජිකයන් විසින් සිදු කරන අතර, සෑම මිනිත්තු 10කට වරක්ම කාන්තාවක් ඝාතනය වේ.

ගෝලීය වශයෙන්, කාන්තාවන්ගෙන් සියයට 6 ක් තම සැමියා හෝ සහකරු හැර වෙනත් කෙනෙකුගෙන් ලිංගික හිංසනයට ලක්ව ඇති බව වාර්තා කරයි. කෙසේ වෙතත්, මෙම ප්‍රචණ්ඩත්වය වටා ඇති විශේෂිත අපකීර්තිය සලකා බැලීමේදී සහකරු නොවන ලිංගික ප්‍රචණ්ඩත්වයේ සැබෑ ව්‍යාප්තිය බොහෝ සෙයින් වැඩි විය හැකිය.

2020 දී, ගෝලීය වශයෙන් අනාවරණය වූ මිනිස් ජාවාරමට ගොදුරු වූ සෑම 10 දෙනෙකුගෙන්ම, වැඩිහිටි කාන්තාවන් හතර දෙනෙක් සහ ගැහැණු ළමයින් දෙදෙනෙක් ඒ අතර සිටී. ලිංගික සූරාකෑමට ලක් වූ වින්දිතයින් ගෙන් සියයට අනූ එකක්ම කාන්තාවන්ය.

වයස අවුරුදු 18 ට පෙර විවාහ වූ වයස අවුරුදු 20-24 අතර කාන්තාවන්ගේ ගෝලීය අනුපාතය 2010 දී හතරෙන් එකක් පමණ සිට 2022 දී පහෙන් එකක් (සියයට 19) දක්වා අඩු විය. 2030 වර්ෂයේදී ගැහැණු ළමයින් මිලියන 9 ක් ළමා වියේදී විවාහ වන අතර දුප්පත්ම සහ වඩාත්ම ආන්තික ප්‍රජාවන්ගේ ගැහැණු ළමයින් පීඩාවට පත් වේ.

මෙම ප්‍රචන්ඩත්වයන්ට එරෙහිව දැනුවත් කිරීම් සහ මහජන විරෝධය වර්ධනය වෙමින් පවතින අතර, කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම, එය උත්සන්න වීම නැවැත්වීම, දිවි ගලවා ගත් අයට ප්‍රමාණවත් සේවාවන් සැපයීම සහ අපරාධකරුවන්ට දඬුවම් කිරීම සඳහා තවත් බොහෝ දේ කළ යුතුව ඇත.

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නැවැත්වීමට එක්වන්න. ඔබට හැකි පමණ ඔබේ යුතුකම ඉටු කරන්න. එහි සාමූහික ප්‍රතිඵලය තුළින් ඔබ අප පතන සාධාරණ ලෝකය නිර්මාණය වනු ඇත.

යසාරා විදුමිණී



# ගෞරවණීය ඔසප් වීම මානව අයිතිවාසිකමකි

**ඔසප්** වීම යනු කාන්තාවක් විසින් සිදු කරන තේරීමක් නොව ජීව විද්‍යාත්මක සංසිද්ධියක් වන අතර එහිදී කාන්තාවකට ඔසප් සනීපාරක්ෂක නිෂ්පාදන මූලික අවශ්‍යතාවක් බවට පත් වේ. එබැවින් ඔසප් සනීපාරක්ෂක නිෂ්පාදන සඳහා ප්‍රවේශය අත්‍යවශ්‍ය මානව අවශ්‍යතාවයක් වේ. ඔසප් දරිද්‍රතාවය යනු ඔවුන්ට අවශ්‍ය ඔසප් නිෂ්පාදන සඳහා ආරක්ෂිතව හා සෞඛ්‍යාරක්ෂිතව ප්‍රවේශ විය නොහැකි මෙන්ම ගෞරවාන්විතව තම ඔසප් කාලය කළමනාකරණය කිරීමට නොහැකි පුද්ගලයන්ට බලපාන ගෝලීය ගැටලුවකි.

ඔසප් සෞඛ්‍යය ද මහජන සෞඛ්‍ය මෙන් ප්‍රමුඛ මානව හිමිකම් ගැටලුවකි. නිසි සෞඛ්‍යාරක්ෂිත පිළිවෙත් ඔසප් සමය තුළ අනුගමනය නොකිරීම සෞඛ්‍ය ගැටලුවලට තුඩු දෙන බැවින් එය සෞඛ්‍යයට සහ යහපැවැත්මට වැඩි බලපෑමක් ඇති කරයි. ඔසප් නිෂ්පාදන සඳහා ආරක්ෂිතව හා සෞඛ්‍යාරක්ෂිතව ප්‍රවේශය ආර්ථික අර්බුදය, ආහාර හා ආහාර නොවන ද්‍රව්‍යන්හි මිල ඉහළ යෑම, ස්වාභාවික හා ස්වාභාවික නොවන හදිසි විපත් මෙන්ම දරිද්‍රතාවය හේතුවෙන් අඩාල කිරීම සිදු කරයි. නව යොවුන් වියේ පාසල් යන දැරියන්ට ඔසප් දරිද්‍රතාවය හේතුවෙන් පාසල් පැමිණීම අඩු වීමේ අනුපාතය ඉහළ යාම පමණක් නොව පාසල තුළ ක්‍රීඩා කටයුතු හා විශය බාහිර කටයුතුවලට සහභාගී වීමට අවකාශය ඇහිරී යාම ද දැක්විය යුතුය. මේ හේතුවෙන් මසකට දින 2ක් හෝ ඊට අඩු දවස් ප්‍රමාණයක් පාසල් නොයෑම විශේෂ තත්වයකි. එපමණක් නොව මුළු දවසම එකම සනීපාරක්ෂක තුවායක් භාවිතා කිරීම මෙන්ම එක් වරක් පමණක් භාවිත කල හැකි නිෂ්පාදන නැවත නැවත භාවිතා කිරීමට හෝ අපිරිසිදු රෙදි වැනි විකල්ප භාවිතා කිරීමට බරපතල සෞඛ්‍ය අවදානම් ඇති කර තිබේ. තවදුරටත් පිරිසිදු සහ ආරක්ෂිත ජල පහසුකම් නොමැති වීම මෙන් ම පොදු ස්ථානවල ඒ සඳහා පහසුකම් සපයා නොතිබීම ද නිසි පරිදි කුණු කසළ බැහැර කිරීමේ ක්‍රමවේදයක් බොහෝ ස්ථානවල නොමැති වීම ද මෙයට හේතු සාධක වී ඇත. ඔසප් දරිද්‍රතාවය ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගීත්වය සීමා කළ හැකි බැවින් එය තිරසාර ආර්ථික වර්ධනයට සුවිශාල බලපෑමක් සිදු කරයි.

ඔසප් දරිද්‍රතාවයෙන් මිදීමට වගකිව යුතු පාර්ශවයන්ට ක්‍රියාත්මක කල හැකි යෝජනා පහත පරිදි දැක්විය හැක. ඔසප් සනීපාරක්ෂක නිෂ්පාදන අත්‍යවශ්‍ය නිෂ්පාදන ලෙස සලකා ඒවාට වඩාත් ප්‍රවේශ විය හැකි සහ දැරිය හැකි මිලකට පත් කිරීම සඳහා මේවායේ ඇති සියලුම බදු/ගාස්තු ඉවත් කිරීමට කටයුතු කිරීම මෙන් ම අධ්‍යාපනය සහ දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ආරම්භ කිරීම ද කටයුතු සැලසිය හැක. ඔසප් සනීපාරක්ෂක ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා රජය දේශීය නිෂ්පාදකයන්ට සහාය දීම හෝ දිරිගැන්වීම ද සිදු කළ හැකිය. එනමුත් වැඩි වශයෙන් දේශීය නිෂ්පාදකයින් දිරිමත් කිරීම වඩා තරඟකාරී මිලකට හේතු විය හැකි බැවින් නැවත භාවිතා කළ හැකි නිෂ්පාදන නිපදවීම සඳහා දිරි ගැන්වීම සිදු කළ හැක. මෙහදී නැවත භාවිතයට ගත හැකි රෙදි භාවිතයෙන් නිපදවූ සනිපාරක්ෂක තුවා නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ප්‍රමාණවත් දැනුවත් කිරීමක් සමඟින් ලබා ගත හැකි හොඳ තත්ත්වයේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම ආර්ථිකය හා හරි හරියට ගැටෙන කාන්තාවන්ට පමණක් නොව පාසල් යන දැරියන්ට ද ආර්ථික නිදහසට කුඩා පියවරකින් හෝ පියමැනීමට මෙන් ම සෞඛ්‍යාරක්ෂිත මෙන්ම පරිසර හිතකාමී ලෙස ගෞරවනීය ඔසප් වීමට ඉඩ සලසා දීමට තම තම හැකි පමණ දායක වෙමු.

**යසාරා විදුමිණී**

# ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය අයිතිවාසිකම් පිළිබඳ පුහුණු සැසිය





ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය අයිතිවාසිකම් පිළිබඳ පුහුණු සැසියේ ගම්පහ දිස්ත්‍රික්කයේ පළමු අදියර ඔක්තොම්බර් මස 03 වන දින GOOD WOOD Airport Hotel පරිශ්‍රයේ දී පැවැත්විණි. ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ දැනුම වර්ධනය කිරීම සහ එම දැනුම ප්‍රජාව තුළට රැගෙන යාමට නායකත්වයක් ගොඩනැගීමේ අරමුණින් සංවිධානය කරන ලද මෙම සැසිය සඳහා කටුනායක බියගම වෙළඳ කලාපයේ ඇඟළුම් කම්හල් වල සේවය කරන කම්කරු කාන්තාවන් සහ ඩාබිඳු සාමූහිකයේ නිළධාරී මණ්ඩලය ඇතුළු විසිපස් දෙනෙකු ඊට සහභාගී විය. එහි දී ලිංගික ප්‍රජනන පද්ධතිය සහ එහි ක්‍රියාවලිය සම්බන්ධවත් ඒ පිළිබඳව පුද්ගලයින් අතර පවතින මතයන් සහ විවිධ ප්‍රදේශයන්හි පවතින අදහස් පිළිබඳව සාකච්ඡා කරන ලදී. මෙම වැඩසටහන මෙහෙය වීම සඳහා සම්පත් දායිකා පබා දේශප්‍රිය මහත්මිය සම්බන්ධ විය.

# ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය අයිතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනේ දෙවන අදියර ඔක්තොම්බර් මස විසිවන දින කිලිනොච්චි ප්‍රාදේශීය සෞඛ්‍යය අධ්‍යක්ෂ සේවා කාර්යාලයේ දී පවත්වනු ලැබීය. එම වැඩසටහන සඳහා සම්පත් දායකත්වය ලබා දෙමින් කිලිනොච්චි සෞඛ්‍යය වෛද්‍ය සේවා නිළධාරි කාර්යාලයේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී වෛද්‍ය ගජේන්ද්‍රන් මහතා සහ කිලිනොච්චි දිස්ත්‍රික් රෝහලේ සේවයේ නියුතු ප්‍රියා මහත්මිය කටයුතු කරන ලදී. එහි දී ප්‍රජනන සෞඛ්‍ය සම්බන්ධව දැනුවත් කිරීම් සිදු කරන ලදී. ඒ අනුව ඔසප් වීම, ආර්ථවහරණය සහ ඒ ආශ්‍රිත රෝග පිළිබඳවත් ගබ්සා වීම් සහ පවුල් සැලසුම් කිරීම් ගැන දැනුවත් කිරීම සහ මහජන සෞඛ්‍ය නිළධාරී කාර්යාලය තුළින් මහජනතාවට සැලසෙන සේවාවන් සහ එදින පැමිණි අලුත විවාහ වූ පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිණිය හමු වී ලියාපදිංචි වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී. තවද කණ්ඩායම් ක්‍රියාකාරකම්



හරහා වෘත්තීය සෞඛ්‍යය පිළිබඳව පවතින ගැටලු, කර්මාන්තශාලා තුළ පවතින ලිංගික අතවරයන්, ප්‍රවාහනය තුළ පවතින හිංසනයන් සම්බන්ධ ගැටලු සාකච්ඡා කරන ලදී. මේ සඳහා ඇඟළුම් කම්හල් වල සේවයේ නියුතු සේවිකාවන් තිස් දෙනෙකු සම්බන්ධ විය.

# බියගම නායකත්ව පුහුණු වැඩමුළුව



බියගම සහ කටුනායක නායකත්ව පුහුණු වැඩමුළුවේ දෙවන අදියර නොවැම්බර් මස 13 වන දින බියගම පි.ටී. ගාර්ඩන් හෝටල් පරිශ්‍රයේ දී පවත්වන ලැබිණි. කම්කරු අයිතිවාසිකම් සහ ඇඟළුම් කර්මාන්තශාලා ආශ්‍රිත ගැටලු විසඳා ගැනීමට මැදිහත්වීමට අවශ්‍ය නීතිමය දැනුම බෙදා දීම අරමුණු කරගනිමින් පවත්වනු ලැබූ මෙම සැසිය තුළින් කණ්ඩායම් ක්‍රියාකාරකම් හරහා තම සේවා ආයතන වල පවතින ගැටලු හඳුනා ගනිමින් ඔවුන් විසින්ම ඊට අදාළ විසඳුම් නිර්දේශ කිරීමට කටයුතු කරන ලදී. මෙම සැසිය සඳහා වෙළඳ කලාපයේ සේවයේ නියුතු සේවිකාවන් විසිදෙනෙකු සම්බන්ධ වූ අතර වැඩමුළුව පැවැත්වීම සඳහා නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර සහ නීතිඥ තරුෂි දිෂාරා විසින් සම්පත් දායකත්වය සපයන ලදි.





# ඇඟම්ලු කම්හල් තුළ සේවය කරන කාන්තාවන්ගේ සෞඛ්‍යය හා සම්බන්ධ ගැටලු පිළිබඳව මහජන සෞඛ්‍යය සේවා නිළධාරීන් සංවේදනය කිරීමේ වැඩමුළුවක් බියගම දී



ඩාබිඳු සාමූහිකය විසින් 2024 ඔක්තෝබර් මස 11 වන දින මහජන සෞඛ්‍යය සේවා නිළධාරීන් මූලික කරගනිමින් ඇඟලුම් කම්හල් තුළ සේවය කරන කාන්තාවන්ගේ සෞඛ්‍යය හා සම්බන්ධ ගැටලු පිළිබඳව සංවේදනය කිරීමේ වැඩමුළුවක් වවුනියාවේ මහජන සෞඛ්‍යය සේවා නිළධාරී මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. ඒ සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිළධාරීන්, මහජන සෞඛ්‍යය පරීක්ෂණ නිළධාරීන් සහ වෛද්‍යවරුන් 90දෙනෙක් සම්බන්ධ විය.

ලිංගික ප්‍රජනක සෞඛ්‍යය අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූලික කරගනිමින් පවුල් සෞඛ්‍යය සේවා නිළධාරීනියන් දැනුවත් කිරීම අරමුණු කර ගනිමින් සැසි පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාප සහ කිලිනොච්චි වව්නියා වැනි නිෂ්පාදන ප්‍රදේශ වල කම්කරු කාන්තාවන් සහ LGBTQA+ ප්‍රජාව මුහුණ දෙන ප්‍රචණ්ඩත්වය පදනම් කරගත් ගැටලු පිළිබඳවත්, සංක්‍රමණික අවදානමට ලක්විය හැකි කාන්තා සේවක ප්‍රජාවට ලිංගික හා ප්‍රජනක අයිතිවාසිකම් උල්ලංඝනය වීම් වලදී ප්‍රතිචාර දැක්වීම සඳහා ක්‍රියාකාරී හවුල්කරුවන් ලෙස කටයුතු කිරීමට මහජන සෞඛ්‍යය සේවා නිළධාරීනියන් දිරිමත් කිරීම සහ සෞඛ්‍යය අංශය සහ සිවිල් සමාජ සංවිධාන සමඟ සම්බන්ධ වීමේ හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම වැඩි දියුණු කිරීම සඳහා වැඩසටහන තුළ දී කටයුතු කරන ලදී. නිදහස් වෙළඳ කලාපයේ සහ අනෙකුත් නිෂ්පාදන ක්ෂේත්‍රවල කාන්තාවන්ගේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සම්බන්ධව මෙහි දී වැඩිදුරටත් සාකච්ඡා කරන ලදී.

# සිල්වෙස්ටර් ජයකොඩි උපහාර දැක්වීම - "ආදරණීය ජයකොඩි"




සිල්වෙස්ටර් ජයකොඩි මහතාගේ වෘත්තීය සමිති නායකත්වය සහ ක්‍රියාකාරීත්වය ඉතා ඉහළින් අගය කරමු. වැඩ කරන පන්තියේ ව්‍යාපාරයක් ලෙස හා කාන්තාවන් සමඟ ක්‍රියා කරන වෘත්තීය සමිතියක නායකයෙකු ලෙස ඔහුගේ ක්‍රියාකාරීත්වය ප්‍රශංසනීය ය. පුරුෂ මූලික වෘත්තීය සමිති ව්‍යාපාරයේ කාන්තාවන්ට ඇති අයිතිය වෙනුවෙන් පෙනී සිටිමින් කාන්තා මූලික වෘත්තීය සමිති වෙනුවෙන් ඉඩ සලසා දීම වෙනුවෙන් ඔහු දැරූ උත්සහය ඩාබිඳු සාමූහික සංගමය වෙනුවෙන් අගය කරමු.

# "නිමා නොවන මතක වසන්තය" විද්‍යුත් පොත එළි දැක්වීම

කාන්තාව හා මාධ්‍ය සාමූහිකය මඟින් නිමා නොවන මතක වසන්තය පොත සුනිලා අබේසේකර මහත්මියගේ දසවස් මතක සැමරුම වෙනුවෙන් හා 70වෙනි උපන් දිනය නිමිති කර ගනිමින් ප්‍රකාශයට පත් කරන ලදි. එහි පස්වන පරිඡේදයෙන් උපුටාගත් කොටසක් පහතින් දැක්වේ.

**මා හිතවත් ආදරණීය සුනිලා සොයුරිය - එච්.අයි. සමන්මලී**

"එවකට රට තුළ පැවති ජාතිවාදය හිස ඔසවමින් සිටි අතර, ගොවි වතු කම්කරු ආයතන ගණනාවක වැඩ වර්ජන හට ගෙන තිබුණු 1982 වර්ෂයේ පැවති පොලිටෙක්ස් ගාර්මන්ට් වැඩවර්ජනය හා යුනියන් කාබයිට්හි පැවති වැඩවර්ජනයට සාධාරණය ඉටුකර ලීමට පුරෝගාමී වූයේ සුනිලා සහෝදරියනි ඔබය. ඔබ හට සමීප වීමට මා හට අවස්ථාව ලැබුණේ, ඒකල කාර්මික ජනපදයේ කර්මාන්ත ශාලාවල ඇති වූ වැඩ වර්ජන තුළිනි."



# නිදහස් වෙළඳ කලාප ජීවිතයේ සැබෑ ගැටලු සම්බන්ධ වටමේස සාකච්ඡාව

නිදහස් වෙළඳ කලාපයේ රැකියාවල නිරතවන විශාල පිරිසක් දෛනික ජීවිතයේ බොහෝ ගැටළුකාරී තත්වයන්ට මුහුණ දීමට සිදුවේ. රැකියාව සම්බන්ධ ගැටළු වගේම රැකියාව හේතුවෙන් සාමාන්‍ය ජීවිතයේ ඔවුන් මුහුණ පාන ගැටළු ප්‍රමාණය ඉතා අධිකය. ඇඟළුම් කර්මාන්ත සේවකයින්ගේ අයිතීන් වෙනුවෙන් ක්‍රියාත්මක වන වෘත්තීය සමිති කිහිපයක් නියෝජනය කරන වෘත්තීය සමිති නායකයින් වන

ඩාබිඳු සාමූහිකය වෙනුවෙන් චමිලා තුෂාරී මහත්මිය, ස්ටෑන්ඩ් අප් මූව්මන්ට් ලංකා වෙනුවෙන් අශිලා දංදෙණිය මහත්මිය ද රෙඩ් සංවිධානය වෙනුවෙන් චන්ද්‍රා දේවනාරායන මහත්මිය සමඟ නීතිය හා සමාජ භාරය වෙනුවෙන් සකුණ ගමගේ මහතාගේ මෙහෙයවීමෙන් ද ඇඟළුම් ක්ෂේත්‍රයේ තවමත් නොවිසඳුණු ගැටලු සම්බන්ධයෙන් මෙම වැඩසටහනින් සාකච්ඡාවට ගැණිනි.

# නිදහස් වෙළඳ කලාප කම්කරු සහයෝගීතාවය 2024 ඔක්තෝබර් 23 දින සංවිධානය කරන ලද මාධ්‍ය හමුව



නිදහස් වෙළඳ කලාපවල සහ කාර්මික ප්‍රදේශවල සේවයේ නියුතු සේවක සේවිකාවන්ගේ කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් පෙනී සිටින සිවිල් සමාජ සංවිධාන එකතුවක් වන නිදහස් වෙළඳ කලාප කම්කරු සහයෝගීතාවය 2024 ඔක්තෝබර් 23 දින සංවිධානය කරන ලද මාධ්‍ය හමුවකදී මෙම සංවිධාන තීරනාත්මක ඉල්ලීම් දෙකක් අවධාරණය කර ඇත. එනම් කම්කරුවන්ට ඔවුන්ගේ ලියාපදිංචි ප්‍රදේශවලට යාමට අවශ්‍ය නොවී, ඉදිරි මහ මැතිවරණයේ දී කම්කරුවන්ට ඔවුන්ගේ වත්මන් සේවා ස්ථානවල සිට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දීම සහ කම්කරුවන් මුහුණ දෙන අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව දැනුවත් කිරීම. කටුනායක, බියගම, වතුපිටිවල සහ මීරිගම ඇතුළු ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාපවල කම්කරුවන් 80,000න් සියයට 22 කට පමණක් ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබුණි.

නිඃවෙඃකඃ කම්කරුවන් සඳහා වූ සිවිල් සමාජ සංවිධාන කණ්ඩායම්වල නියෝජිතයන් ප්‍රකාශ කළේ බොහෝ කම්කරුවන්ට ඡන්දය දීමට නොහැකි වූයේ ඔවුන්ගේ "පැමිණීමේ දීමනාව කපා හරින" බැවිනි. ඇත්ත වශයෙන්ම, පවතින ආර්ථික අර්බුදය සහ අධික ජීවන වියදම මධ්‍යයේ ඔවුන්ට දරාගත නොහැකි මූල්‍ය පාඩුවක් වූ බැවින් ඔවුන්ගේ පැමිණීමේ දීමනාව නවතා දමා ඇත. මෙම ගැටලු පැන නගින්නේ පෞද්ගලික සමාගම් සමඟ නොව රටේ ඉහළම ඇඟලුම් ක්ෂේත්‍රයේ ආදායම් ලබන්නන් සමඟ බව ධාබිඳු සාමූහික සංගමයේ ප්‍රධාන ලේකම් චමිලා තුෂාරී මහත්මිය සඳහන් කළාය.

ජනාධිපතිවරණයට පසුදින ඇඳිරි නීතිය යෙදීම නිසාත් ප්‍රවාහනය පහසුකම් නැවත යාවත්කාලීන කිරීමට ප්‍රමාද වීම නිසා ඡන්දය භාවිත කිරීමට ගම්බිම් බලා පිටත් වූ වෙළෙඳ කලාප සේවක සේවිකාවන් නැවත සේවා ස්ථානවලට වාර්තා කිරීම ප්‍රමාද විය. මෙය හේතුවක් කොටගෙන පැමිණීමේ දීමනාව ලෙස ගෙවනු ලබන රුපියල් 5,000 - 10,000ත් අතර මුදලක් අහිමි වී ඇති බවද වැටුපෙන් මෙවැනි ප්‍රමාණයක් අහිමි කර ගන්නවා වෙනුවට ඡන්දය භාවිත නොකර සිටීම සුදුසු බැවින් මෙවර පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ඡන්දය භාවිතා නොකරන ප්‍රමාණය මීට වඩා ඉහළ යා හැකි බව ද ශ්‍රම අභිමානී කේන්ද්‍රය වෙනුවෙන් සුගත් රාජපක්ෂ මහතා සඳහන් කළේය.

මෙම ගැටලුව සම්බන්ධයෙන් 2015 වසරේ සිට මැතිවරණ කොමිසම ඇතුළු වගකිව යුතු නිරීක්ෂණ ආයතන දැනුවත් කිරීමට පියවර ගෙන ඇතත් තවමත් නිසි ක්‍රමවේදයක් සකස් කර දී නැතැයි මෙම මාධ්‍ය සාකච්ඡාවට එක් වූ නීතිඥ තරුශි දිශාරා මෙනවිය පැවසුවාය.

# අතුරුදහන්වූවන් අනුස්මරණය 2024 ඔක්තෝබර් 27 රද්දොළුගම දී

ජනාධිපතිවරණයෙන් මාසයකට පමණ පසු අතුරුදහන් වූවන්ගේ 34 වැනි වාර්ෂික සැමරුම සඳහා වසර ගණනාවක් තිස්සේ අතුරුදන් වූ සමීපතමයන්ගේ සිය ගණනක් ඥාතීන් සහ හිතවතුන් සීදූව නගරයට රැස්ව සිටියහ. මෙහිදී මානව හිමිකම් කොමිෂන් සභාව, නීතිඥවරු, සිවිල් සමාජ සංවිධාන ක්‍රියාකාරීන්, පූජකවරුන් ඇතුලු පිරිසක් එක්ව සිටියහ.






# දැන යමු හරි මඟ

## 1. එච්.අයි.වී. යනු කුමක්ද? ඒඩ්ස් යනු කුමක්ද?

එච්.අයි.වී. යනු වෛරසයකි. එච්.අයි.වී.වී යන්නෙන් අදහස් කරන්නේ මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසයයි. ඒවා තමන්ගේම නව පිටපත් සෑදීමට සජීවී ජීවියෙකුගේ සෛල ආසාදනය කිරීමට අවශ්‍ය වේ. මානව ප්‍රතිශක්තිකරණ පද්ධතිය සාමාන්‍යයෙන් වෛරස් ඉතා ඉක්මනින් සොයාගෙන මරා දමයි, නමුත් එච්.අයි.වී. ප්‍රතිශක්තිකරණ පද්ධතියටම පහර දෙයි. පුද්ගලයෙකු එච්.අයි.වී. ආසාදනය වූ විට, වෛරසය ක්‍රමයෙන් ප්‍රතිශක්තිකරණ පද්ධතියට පහර දෙන අතර ප්‍රතිකාර නොමැතිවුවහොත් සෛල වලට හානි කරයි

ඒඩ්ස් යනු රෝගී තත්ත්වයකි. ඒඩ්ස් යනු අත්පත් කරගත් ප්‍රතිශක්ති ඌනතා සින්ඩ්‍රෝමයයි. ආසාදන වලට එරෙහිව සටන් කිරීමට නොහැකි තරම් ප්‍රතිශක්තිකරණ පද්ධතිය දුර්වල වූ විට පුද්ගලයෙකු ඒඩ්ස් රෝගයෙන් පෙළෙන බව හඳුනා ගනී. එච්.අයි.වී. ආසාදනයේ සිට ඒඩ්ස් අවධිය දක්වා ඉදිරියට යාමට වසර 8-10ක් පමණ ගත වේ.

## 2. එච්.අයි.වී. ආසාදනයේ මුල් රෝග ලක්ෂණ මොනවාද?

ඔබට එච්.අයි.වී. ආසාදනයේ මුල් අවධියේදී උණ වැනි වැනි රෝග ලක්ෂණ ඇති විය හැක, එහිදී ඔබට උණ, උගුරේ අමාරුව සහ ශරීරයේ කැක්කුම ඇති විය හැකි අතර, ඒවා කිසිදු ප්‍රතිකාරයකින් තොරව පහව යනු ඇත. ඔබට මුල් අවධියේදී කිසිදු රෝග ලක්ෂණයක් පවා නොපෙන්වයි. ඔබට යම් රෝග ලක්ෂණ ඇති වුවද, ඔබ දැඩි ලෙස සැක කරන්නේ නම් මිස එච්.අයි.වී. ආසාදනය පහසුවෙන් මග හැරිය හැක

## 3. මට එච්.අයි.වී. පරික්ෂා කර ගත හැක්කේ කොතැනින්ද?

ඔබට ඕනෑම ලිංගාශ්‍රිත රෝග සායනයකින් හෝ රසායනාගාරයකින් වෛද්‍යවරයා/සෞඛ්‍ය සේවකයා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු එච්.අයි.වී. සඳහා පරීක්ෂා කර ගත හැක. මෙම සාකච්ඡාව ඔබට ඔබගේ ගැටළු සාකච්ඡා කිරීමට, තොරතුරු ලබා ගැනීමට සහ සහය ලබා ගැනීමට අවස්ථාව සලසා දිය යුතුය. ලිංගාශ්‍රිත රෝග සායනවලදී පුහුණු වෛද්‍ය කාර්ය මණ්ඩලය රහස්‍ය භාවය රැක ගනිමින් පූර්ව සහ පශ්චාත් පරීක්ෂණ උපදේශන කටයුතු සිදු කරයි. දිවයින පුරා සායන 41 ක් ඇති අතර ඔබට නොමිලේ එච්.අයි.වී. පරික්ශා කර ගත හැක.

## 4. ඒඩ්ස් රෝග ලක්ෂණ මොනවාද?

පුද්ගලයෙකුට ඒඩ්ස් රෝගය වැළඳී ඇති බව හඳුනාගනු ලබන්නේ අවස්ථාවාදී ආසාදනයක් හෝ ඒඩ්ස් ආශ්‍රිත පිළිකාවක් ලෙස හැඳින්වෙන ඒඩ්ස් ආශ්‍රිත තත්ත්වයක් හෝ රෝග ලක්ෂණයක් වර්ධනය වූ විටය. දුර්වල වූ ප්‍රතිශක්තිකරණ පද්ධතියක් මඟින් ලබා දෙන අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නා බැවින් ආසාදන අවස්ථාවාදී ලෙස හැඳින්වේ. අවස්ථාවාදී ආසාදනයක් වර්ධනය වී නොමැති වුවද, ඒඩ්ස් රෝගයෙන් පෙළෙන කෙනෙකුට හඳුනාගත හැකිය. එච්.අයි.වී. ආසාධිත පුද්ගලයෙකුගේ රුධිරයේ ඇති ප්‍රතිශක්තිකරණ පද්ධතියේ සෛලෙ (CD4 සෛල) ප්‍රමාණය යම් මට්ටමකට වඩා පහත වැටුණු විට ඒඩ්ස් රෝග විනිශ්චය කළ හැකිය.

## 5. මට එච්.අයි.වී. ආසාදනය වී ඇති බව දැන ගත හැක්කේ කෙසේද?

එච්.අයි.වී. ආසාදනය වූ විට, ඔබ ආසාදනය වී ඇති බව ඔබට දැනෙන්නේ නැත, නැතහොත් ඔබට ආසාදනයක් ඇති බව අන් අයට පිටතින් නොපෙනේ. ඔබට එච්.අයි.වී. ආසාදනය වී ඇත්දැයි සොයා ගැනීමට ඇති එකම ක්‍රමය එච්.අයි.වී. පරීක්ෂණයක් සිදුකිරීමයි. එච්.අයි.වී. රුධිරය හෝ කෙල සමඟ පරීක්ෂා කළ හැක.

## 6. එච්.අයි.වී. සඳහා ප්‍රතිකාර තිබේද? සහ පවතින ප්‍රතිකාර වලින් එච්.අයි.වී. සුව කල හැකිද?

ඔව්, වෛරස් තමන්ගේම නව පිටපත් සෑදීම පාලනය කිරීම සඳහා එච්.අයි.වී. සඳහා ප්‍රතිකාර පවතින අතර ඒවා සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට උපකාරී වනු ඇත. පවතින ප්‍රතිකාර මගින් එච්.අයි.වී. සුව කළ නොහැකි නමුත් වෛරසය පාලනය කළ හැකිය. එබැවින්, ඔබ ජීවිත කාලය සඳහා ඖෂධ ලබා ගත යුතු අතර ගුණාත්මක, සාමාන්‍ය ජීවිතයක් ගත කළ හැකිය.

## 7. ලිංගාශ්‍රිත රෝග සායනයට පැමිණීමට ඔබට වෛද්‍යවරයෙකුගේ යොමු කිරීමක් අවශ්‍යයද? සහ සායන වේලාවන් මොනවාද?

ඔබට යොමු කිරීමකින් තොරව ඕනෑම ලිංගාශ්‍රිත රෝග/ලිංගික සෞඛ්‍ය සායනයකට යා හැක. සතියේ දිනවල පෙ.ව. 8 - ප.ව. 4 සහ සෙනසුරාදා පෙ.ව. 8 - ප.ව. 12.

**සෞඛ්‍ය අමාත්‍යංශයේ ශ්‍රී ලංකා ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහනෙහි වෙබ් පිටුවෙන් උපුටාගැනුමකි.**

# සිතුවිල්ල


වැඩ මුරය නිමා වී බෝඩිමට එන අවස්ථාවේදී පසු පසින් පැමිණි බයිසිකලේ බ්‍රේක් පාරට මගේ සිතුවිලි මැකී ගියේය. ආ නංගි, මොකද අද තනියම කෝ ගැන්සිය? මොකද අද පයින් කොටන්නේ? අපිට මේ දවස්වල O.T ත් නැහැනේ, ඉතින් අපිටත් ඔය සන්තෑසිය තමයි. මේ දවස්වල කෝඩේ තමයි, මේ එකෙන් තමයි දුවන්නේ.

අපි රජයේ සේවකයින් නෙවෙයිනේ. වැටුප් වැඩිවීම් වෙනත් දීමනා ලැබෙන්නේ නැහැනේ. ලැබෙන්න තියෙන දේවලුත් කපා ගන්නවා මිසක්. ඒ වුනාට සංඛ්‍යාලේඛනවල සඳහන් වන්නේ රට තුලට විදේශ විනිමය ලබා දෙන්නේ අපි ලු. ලෝකෙට පරකාසේ කලාපෙට මරගාතේ තමයි. මන්ද පෝෂණයෙන් පෙලෙන්නේ අපියි, සමබල ආහාර වේලක් නැතුව. ඇටසැකිල්ල නැත්නම් ශරීර කුඩුව බිම. අම්මද බොල නංගි දන්න දේවල්? ඒ විතරක් නෙවෙයි හිංසනය, පීඩනය මානසිකව බලපාලා තියෙන්නේ. අපිට තමයි මේ ඔක්කොම. ඇයි අපි මේ නිදහස් වෙළඳ කලාපේ කෙල්ලොනේ. ඒ නිසා විවාහයක් කර ගැනීමටත් ප්‍රශ්නයක් වෙනවා. රටේ සංවර්ධනයට දායකත්වය ලබා දෙන විට අපි ආශ්චර්ය දියණියෝ. කබරයත් තලගොයා වෙනවලු.

නොවැම්බර් මස 26වෙනිදාට යෙදී ඇත්තේ කාන්තාවන්ට සිදුවන ප්‍රචණ්ඩත්වයට එරෙහි දිනයලු. නමුත් දිනපතාම ඇසුවොත් බැලුවොත් කාන්තාවන්ට සිදුවන හිංසනය, දූෂණය, මරා දැමීම්, ප්‍රචණ්ඩත්වය කෙතරම් සිදුවෙනවාද? අපේ අම්මා මුත්තා කාලයේදී සිදු නොවන සිද්ධීන් අද කොතරම් ද? සාපරාධී ක්‍රියා කෙතරම් සිදු වෙනවාද? රටේ තාක්ෂණය දියුණු වෙලාද, සංවර්ධනය වෙලාද? නමුත් විවිධ මත් ද්‍රව්‍ය භාවිතා වීම තුළ රට අගාදයට පත්වීමක් දක්නට ඇත. කුඩා දරුවන් පවා අපයෝජනයට ලක් වී ඇත. පාසැල් ළමුන් පවා සිය දිවි හානී කර ගැනීම් සිදුවේ. මතට තිත කීවට විවිධ මත් ද්‍රව්‍ය නිසා කෙතරම් මිනිස් ජීවිත විනාස වෙනවාද? කුඩා දරුවන් පවා නොමඟ ගිහින් ඇත. අපි වෙළඳ කලාප තුළ දුක් විඳිනවා. ආයෝජකයින් කර්මාන්තශාලා වසා දමා ගියොත් නැවත අපිට ගමට යන්න තමයි සිදුවෙන්නේ. ගමේ ගියයි කියලා මොනවා කරන්නද? කුඹුරු කොටන්න, ගොවිතැන් කරන්න, වතුර කලයක් උකුළේ තබා ගෙන එන්න තරම් පෙර මෙන් දැන් බැහැ. ඒ තරමට අපේ ශරීරය දුර්වල වෙලා වයසටත් ගිහින්, කලාපයට ශ්‍රමය වගුරලා. අනේ අපේ කෙල්ලන්ට බුද්ධං සරනේ සරණයි.

සමන්තා

# ප්‍රහේලිකා අංක - 48




## පහළට

1. සෑම පුද්ගලයෙකුම කිසිඳු බේදයකින් තොරව බලාපොරොත්තු වේ.
3. රාත්‍රී කාලයේ හැසිරෙන.
4. බැලු බැල්මට මෙය පුද්ගල එකතුවකි.
6. කෙට්ටු ශරීරයක් ඇත්තී මේ නමින් හැඳින්වේ.
7. රාත්‍රියට සමාන පදයකි.
8. නිශ්චිත සමාජ, ආර්ථික නිෂ්පාදන මාදිලියකට සම්බන්ධ ස්ථාවර එකකි.

## හරහට

1. සෑම මානව සබඳතාවක පැවතිය යුතුම දෙයකි.
2. මූලික මිනිස් අයිතිවාසිකමකි.
3. සියලු මානවයෙකුගේම සියලු අරමුණුවල හරය මෙය වේ.
5. කාන්තාවට සමාන පදයකි.
6. කාන්තාවගේ මෘදු මොළොක් බව හඟවයි.

මෙම ප්‍රහේළිකාව නිවැරදිව පුරවා
මෙම ලිපිනයට එවා තෑගි දිනන්න.
ඩාබිඳු සාමුහිකය
221, වෙළබඩ පාර, කටුනායක.



# ඩාබිඳුව...

මිහිතලය අඳුරු වී
නිසල රැය පහන් වෙයි
නිදි නැතුව නෙත රතුවෙයි
සිත සැලෙන විරාමෙක,
ඩාබිඳුව, අමතන්න
පත් ඉරුව සිනාසෙයි
යොවුන් වියේ රස සිහින
නොදුටු අපෙ ජිවිතේ
සැනසුම ලබන්නට
නුඹත් නොසිටියේ නම්

අහිංසක සිනා රැලි
සඟවා ගත් වේදනා
කෙසේ නම් පවසයිද
කලාපයේ තරුණයන්
ජීවිතයේ යෞවනය
වසන්තය සොඳුරු වූ
නිමාකරලන්නට දෝ
මෙලෙස අපි පෙලෙන්නේ

පාරිශුද්ධ චේතනා
ගෙන ඒද වේදනා
මෙසේ දුක් විඳින්නට
සවිය ඇති මුත් සිතේ
යකඩ නොවූ දෙයක්
කෙසේ එය විඳින්නද
මිනිසෙකුගේ වේදනා
නොදැනෙන තවකෙකුට
උදා හිරු පායයිද
දෙනෙත් හැර බලන්න

ප්‍රියන්ත කොඩිආරච්චි




# වෘත්තීය සමිති ජාල හරහා සැපයුම් දාම කාර්මික සබඳතා ඇති කර ගැනීම

ඔක්තෝබර් 21-22 දිනවල IndustriALL Global Union විසින් ඇඟළුම් සහ පාවහන් බහුජාතික නිෂ්පාදකයින් වන Crystal International Group සහ POU CHEN Corporation හි අනුබද්ධ වෘත්තීය සමිති සමඟ වෘත්තීය සමිති ජාල රැස්වීම් දෙකක් සංවිධානය කරන ලදී. Crystal Group යනු විශාලතම ඇඳුම් නිෂ්පාදකයන්ගෙන් එකක් වන අතර POU CHEN යනු ලොව විශාලතම පාවහන් නිෂ්පාදකයා වේ. සමාගම් දෙකම Nike" Adidas" Asics" New Balance" M&S" PUMA" H&M" Next" Fast Retailing සහ VF Corporations වැනි ප්‍රධාන ඇඟලුම් සහ පාවහන් විලාසිතා සන්නාම සඳහා සපයයි.

මෙම බහුජාතික දැවැන්ත සමාගම් දෙකෙහි කම්කරුවන් නියෝජනය කරන බංග්ලාදේශය, කාම්බෝජය, ඉන්දුනීසියාව, ශ්‍රී ලංකාව සහ වියට්නාමය යන රටවල කාර්මික අනුබද්ධිත සමාගම් වැටුප්, කොන්ත්‍රාත්තු, මාතෘ නිවාඩු, වෘත්තීය සමිති පිළිගැනීම සහ සාමූහික කේවල් කිරීමේ ගිවිසුම්, වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය සම්බන්ධ දැනට පවතින ගැටලු සාකච්ඡා කිරීමට කාම්බෝජයේ නොම් පෙන්හිදී රැස් වූහ.

IndustriALL සහ අනුබද්ධ ආයතන අවබෝධතා ගිවිසුම් හරහා සංගමයේ සහ සාමූහික කේවල් කිරීමේ නිදහස සඳහා සක්‍රීය පරිසරයක් නිර්මාණය කිරීම සඳහා යාන්ත්‍රණයක් ඒකාබද්ධව සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන අතරම කර්මාන්තශාලා කළමනාකරුවන් සහ වෘත්තීය සමිති නියෝජිතයින් ඇතුළු කර්මාන්තශාලා මට්ටමින් කාර්මික සබඳතා ශක්තිමත් කිරීම සඳහා සක්‍රීය පරිසරයක් නිර්මාණය කිරීම ද ඒ අතර වේ.




# කම්කරුවන්ට තවත් එක් කළු දිනයක්

කම්කරුවන්ගේ එකම ඉතිරි කිරීම් (EPF) අඩකින් කපා හරින දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමට එරෙහි නඩුව ඔක්තෝබර් 30 වනදා ශ්‍රේෂ්ඨාධිකරණය නිෂ්ප්‍රභා කරන ලදි. මෙම නඩුවේ පෙත්සම්කරුවන් වූයේ ඩාබිඳු සාමූහික සංගමය සහ එක්සත් කම්කරු සම්මේලනයයි. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල සමන්විත වූයේ ප්‍රීති පද්මන් සූරසේන, කුමුදුනී වික්‍රමසිංහ සහ අචල වෙංගප්පුලි යන විනිසුරුවරුන්ගෙනි. ඩාබිඳු සාමූහික සංගමය සහ එක්සත් කම්කරු සම්මෙලනය වෙනුවෙන් පෙනී සිටි නිතීඥ අර්මිසා ටීගල් මහත්මිය සහ නීතිඥ සාලිය පිරීස් මහතා තර්ක කළේ අරමුදලට රුපියල් බිලියන 1,711 ක් අහිමි වන බවයි. පසුගිය වසරේ මෙවැනිම පෙත්සම් තුනක් නිෂ්ප්‍රභ කළ බවත්, එබැවින් පසුගිය පෙත්සම් විභාගය "**නිෂ්ඵල ව්‍යායාමයක්**" යන රජයේ තර්ක මත පදනම්ව අධිකරණය නඩුව නිෂ්ප්‍රභ කළේය.

ජනතා පරමාධිපත්‍යයක් නැති පසුගිය රජය සේවක අර්ථසාධක අරමුදලට අලාභයක් කරද්දී, නව ජනාධිපතිවරයාට සහ රජයට මේ නීතිය හරවා මේ රටේ වැඩ කරන ජනතා හිතවාදී තීරණයක් මේ මොහොතේ ගැනීමට හැකියාව පැවතුණි. අපි නව රජයෙන් ඉල්ලා සිටින්නේ මෙම නීතිය අවලංගු කර මිනිසුන්ට ඔවුන්ගේ එකම විශ්‍රාම ඉතුරුම්වල සම්පූර්ණ ප්‍රතිලාභ භුක්ති විඳීමෙ අයිතිය තහවුරු කරන ලෙස ය.

අර්ථසාධක අරමුදල ඇඟළුම් ක්ෂේත්‍රයේ කම්කරුවන්ට ඇති එකම සමාජ සංවර්ධන අරමුදලයි. කම්කරුවන්ගෙන් ශ්‍රමය සූරා කමින් ජීවත්වීමට සරිලන වැටුප් නොලඹමින් හිතකර නොවන වැඩ පරිසරයක් තුළ තම ශ්‍රමය වැය කරන්නේ සාධාරණ වැටුප් නොලබාය. රට තුළ සංක්‍රමණය වෙමින් ද කම්කරු නීතිවල සැබෑ රැකවරණය නොලබමින් ද සෞඛ්‍යාරක්ෂිත බවකින් තොරව රටේ ආර්ථිකයට ලබා දෙන දායකත්වය සාධාරණයක්, ගරුත්වයක් දෙනු වෙනුවට රටේ ණය පියවීම සඳහා ඔවුන්ගේ අර්ථසාධක අරමුදලට වැට බැඳීමට කටයුතු කිරීම ඉතාමත් අසාධාරණ ක්‍රියාවකි. ඉතාමත් දුක් මහන්සියෙන් ඉතුරු කරගත් මුදලින් 50%ක පමණ මුදලක් බදු වශයෙන් කපා ගැනීම නිසා ඔවුන් තවදුරටත් ආර්ථික වශයෙන් පහතට වැටෙන අතර දුර්දාන්ත පාලකයින් විසින් ගත් ණය පියවීමට රටේ දුප්පත්ම කොටසගේ අරමුදල් භාවිතා කිරීම ඔවුනට කරන බලවත් අසාධාරණයකි.

අංකඃ 221, වෙළබඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි.